# කිතුල්ගස හා බැඳි පාරිභාෂික ශබ්ද මාලාව

පූජ්‍ය කනංගමුවේ රාහුල හිමි

ස්වභාව ධර්මයේ සෞන්දර්යාත්මක නිමැවුමක් ලෙසින් තුරුලතාවන් හැඳින්විය හැකිය. තුරුලතාවන්ගේ අපූරු නිර්මාණය පරිසරයේ ජීව ගුණයයි. ආධ්‍යාත්මික මෙන්ම භෞතික ලෝකයේ සැනසිල්ල හා සනීපාරක්ෂාව (සෞඛ්‍ය හා ස්වස්ථතාව) උදෙසා තුරුලතාවන්ගේ දැඩි බලපෑම ප්‍රබලය. විවිධ වර්ගයට අයත් තුරුලතාවන් මේ ජීව-අජීව ලෝකයේ ප්‍රාණ වායුව වන බැවින් තුරුලතාවන්ගේ ආරක්ෂාව පිළිබඳව මිනිසාගේ දැඩි අවධානය යොමුවිය යුතුය. එසේ නොවුවහොත් මේ සුන්දර දිවයින කාන්තාරයක් වනු නොඅනුමානය. සත්වයාගේ මූලික අවශ්‍යතා අතර ජලය ප්‍රධාන තැනක් ගන්නා බැවින් වන විනාශය නතර කොට වන සංරක්ෂණය පිළිබඳ කාගේත් දැඩි අවධානය යොමු විය යුතුය. කවර ජාතියක වුවද එය ධර්මානුකූල ප්‍රතිපත්තියට පටහැනි නොවේ. ලාංකේය සමාජය තුළ සිදුවන්නා වූ වන විනාශය ඉතා ඉහළය. ලාංකික භූමි ප්‍රදේශයේ 80% දක්වා වූ වන ගහණ ප්‍රදේශ මේ වනවිට 20% දක්වා අඩු වී ඇත්තේ අපගේම අවධානයේ ප්‍රමාණය මතය. ලෝකයේ කාර්මික විප්ලවයත් සමග සීග්‍රයෙන් වන විනාශය සිද්ධ වේ. යථා දිනකදීම එහි අනිටු ප්‍රතිඵලයක් වශයෙන් උතුරු-දකුණු ධ්‍රැව දියවී යාමෙන් මුළු ලෝකයම විනාශ වීමේ අවධානමක පවතී.

ලොව කාලගුණික තත්වය තුළ සමතුලිතතාව නැතිවීමෙන් දරුණු විපත්වලට (ස්වභාවික) මුහුණ දීමට සිද්ධ වේ. එබැවින් වන රෝපණය හා සංරක්ෂණය පිළිබඳව ලෝක ප්‍රඥප්තියක් හෝ ඇතිකර මේ වන විනාශය නතර කර ගත යුතුය. පරිසර දිනයට පමණක් ප්‍රදර්ශන කාමයෙන් යුක්තව සිදු කරන වන රෝපණය වෙනුවට සැමදා සැමකෙනෙකු විසින්ම වන රෝපණය හා සංරක්ෂණය පිළිබඳ සංකල්පයෙන් ජීවත් වීමේ ජාතික අවශ්‍යතාව වටහා ගත යුතුය. ගසක බස ගැන කීමට මත්තෙන් වන සංරක්ෂණය පිළිබඳ මේ පූර්විකාව ඔබගේ අවධානයට නිතැතින් යොමුවීම අපගේ අභිලාසයයි.

කිතුල් ගස තාල වර්ගයට අයත් ගසක් වන අතර තෙත් කලාපීය ප්‍රදේශවල සරුවට වැඩෙයි. විශේෂයෙන් මධ්‍යම කඳුකරයේ සරුවට වැඩුණු කිතුල්ගස් දැක ගැනීමට පුළුවන. උසින් අඩි 50-60 ක් පමණ වන අතර වටප්‍රමාණය අඩි 04-05 ක් පමණ, ප්‍රමාණයකට කිතුල් ගස වර්ධනය වෙයි. අතීතයේ පටන්ම ආර්ථික හා සමාජික වටිනාකමකින් යුක්ත ගසක් වශයෙන් කිතුල් ගස හැඳින්වීමට පුළුවන. පළාතේ කඳුකර ප්‍රදේශ වල බහුලව වැඩෙන කිතුල් ගස තත් ජනතාවගේ ආර්ථික උත්පාදනයෙහිලා බෙහෙවින් උපකාරී වේ. මෙහිදී අපගේ අවධානය යොමු වන්නේ කිතුල්ගස සම්බන්ධ

විවිධ අවස්ථාවලදී විවිධ අයුරෙන් භාවිත කෙරෙන පාරිභාෂික ශබ්ද මාලාව හඳු
ගැනීමයි. ශාස්ත්‍රීය කෘති විමර්ශනය මෙන්ම පුද්ගල කණ්ඩායම් සාකච්ඡා ක්‍ර
අනුගමනය කිරීම මෙම පර්යේෂණයේ විධික්‍රමය වශයෙන් තෝරා ගත්තේ නිබන්ධ
හර පද්ධතිය ආරක්‍ෂා කර ගැනීම පිණිසයි.

කිතුල් ගසේ පැල අවස්ථාව "නාඹුල්ගහ" යනුවෙන් හඳුන්වන අ
මල්හට ගන්නා අවස්ථාව හෙවත් පූදින අවස්ථාව "කර ඇද්දා" යනුවෙන් හැඳින්වෙ
"හණස්සක්" තුළ හට ගන්නා කිතුල් මල "ගොබය" වේ. එවැනි ගොබ දෙකක් පැමිණි
"කෙටි අත්ත" වන අතර ඉන්පසුව පැමිණෙන මල "මුදුන්මල" යනුයි. "කිතුල පීදුනා" ය
එම අවස්ථාවයි. "තෙලිජ්ජ" යනු එම පීදුන කිතුලෙන් ලබා ගන්නා දියරයකි. ඖෂධය
වශයෙන්ද සුරාවක් ලෙසින්ද තත් දියරය ලබා ගන්නා තෙක් කිතුල්මල හා බැඳි වතාව
රශියකි. මුදුන්මල අසලින්ම පැමිණෙන කිතුල්මලේ අරක්ෂක වළල්ල එනම් "හණස්ස
ඉරා මල අග්ගිස්සෙන් කපා ගහ දෙසට වන්නට පිරිමදිනු ලබයි. "ඉරනවා" "බූ ගානවා
යනු එම අවස්ථාවයි. කහ පාටින් යුක්ත එම පිරිමදින මල තිල්පාට තත්වයට පත් වූ පසු
"හණස්ස" කෙටියට කපා බෙහෙත් තැබීම සිදු කරනු ලබයි. "අත්මල" යන්නෙන
හඳුන්වන්නේ කිතුල් දියර ලබා ගැනීමට ඖෂධ තැබූ එම කිතුල් මලයි. "මලබේත් තැබීම"
යනුවෙන් එම අවස්ථාව සැලකේ.

"තෙලිජ්ජ" නම් දියරය ලබා ගන්නට "මලබේත්" තැබීමේදී
උපයෝගී කර ගන්නා ඖෂධ වර්ග කීපයකි. වියළි මිරිස්, ලූණු, රතුළූණු සහ සුදුළූණු
ගෙඩියක් බැගින්, කුඩු මිරිස් දලු (කටු සහිත වැල්වර්ගයකි) කැප්පෙටියා දලු වල් ඉඟුරු
අල, මුරුංගා පොතු එකට අඹරා ගැනීමෙන් මලබේත සැකසේ.

දින තුනක් තත් ඖෂධය තබා ඒ දින තුනේදීම මල පිරිමැදිය යුතුය.
ඉන්පසු අතින් වියත් දෙකක් පමණ ශේෂ කොට ඉතිරිය කපා දැමිය යුතුය. ඖෂධ සහිත
ශේෂ වූ "අත්මල" ඉහළින් වු කිතුල් අත්තකට ඇද බැදිය යුතුය. පහලට "ගල්ඔත" එල්ලිය
යුතුය. "අත්මල" පහළට බරවීමට බිමට පාත්වන සේ ගලක් හෝ බර ගණ ද්‍රව්‍යයක් එල්ලීම
"ගල්ඔත" නමින් හැඳින්වේ. ඉන්පසුව "තෙලිජ්ජ" නම් දියරය ලැබෙයි. "ගල්ඔත" එල්ලීම
සදහා භාවිත කරන්නේ ශක්ති සම්පන්න ලනුවක් හෝ වැල් වර්ගයකි. "වේංබඩංගා" වැල්
වර්ගය මේ සදහා සුදුසු බව ගැමියෝ පවසති.

"තෙලිජ්ජ" හෙවත් කිතුල් දියරය ලබා ගන්නා භාජනය "ගොටුව"
"පෝනැව" "මුගමය" යන නම් වලින් හඳුන්වයි. පුවක් ගහේ අත්ත (කොලපත) ලබු කට්ට,
බරි කට්ට හෝ පොල්කට්ට ප්‍රධානතම බඳුන් වේ. නූතනයේ මේ සදහා මැටි මුට්ටියක් හෝ
ප්ලාස්ටික් භාජන භාවිත කෙරේ. මේ බඳුනට වැටෙන දියරය "තෙලිජ්ජ" යන නමින්
මෙන්ම "මීරා" යන නමින්ද හැඳින්වේ. මේ කිතුල් දියරට ලබා ගැනීමට "කිතුල් මදින්නාට"
(එනම් කිතුල්මල සකසා දියරය ලබා ගන්නා තැනැත්තා) ගස මුදුනට යා යුතුය. ගසට
නැගීමට භාවිත කරන උපකරණය "හැර බැදිල්ල" යනුවෙන් හඳුන්වයි. මෙම අත්වැලට
නැත්නම් හැර බැදිල්ල ගැට සහිත අඩියක් පමණ උසින් පාද ඔසවා නැගීමට හැකි පියගැට
පෙලක ස්වරූපය දරයි. මේ සදහා උන ගසකට ශක්තිමත් පොලු බැඳ ගැනීම සුලභ
දර්ශනයයි. "හැර බැදිල්ලේ" සිට කිතුල්මල මැදීමේදී ආරක්ෂක ආවරණයක් පැළදිය
යුතුය. "බඳපොට" යනු එම ආරක්ෂක ආවරණයයි. තිත්තවැල්, කඳුරුගෙඩියා වැල් එකට
අඹරා ගැනීමෙන් හෝ ලනු කීපයක් එකට අඹරා ගැනීමෙන් බඳපොට" සකසා ගනු ලබයි

"මීරා" හෙවත් "තෙලිජ්ජ" "රා" නම් සුරාව සාදා ගැනීමටද "හකුරු" හෝ "පැණි" ලබා ගැනීමටද උපකාරී වේ. මීරා අධික ලෙස ස්වභාවිකව පැහීමට ඇරීමෙන්ද, එයට කිතුල් ඇට රෑනක්, කැන්ද පොතු ස්වල්පයක් මිශ්‍රණය කර ගැනීමෙන්ද "රා" නැමැති සුරාව ලැබේ. මීරා උනුකර ගැනීමෙන් පදමට ආකල්හි "පැණි" නම් ද්‍රව්‍ය ලැබේ. එම උකුවට හැරුණු පැණි තව දුරටත් රත්කොට බඳුනකට වත්කොට නිමෙන්නට හැරීමෙන් "හකුරු" නම් ද්‍රව්‍ය ලබාගත හැකිය. "පැණි" මෙන්ම "හකුරු" නම් ද්‍රව්‍ය ලබාගත හැකිය. "පැණි" මෙන්ම "හකුරු" ඖෂධයක් ලෙසද භාවිතයට ගැනේ. ඒවා අධිකව පාවිච්චි කිරීමෙන් උමතු ගතියක් මෙන්ම මත් ගතියකටද පත්වෙන බව ගැමියෝ ප්‍රකාශ කරති. කිතුල් ගසකින් මුලින්ම ලබා ගන්නා මේ ද්‍රව්‍ය බුද්ධ පූජාවටද තැම්පත් කිරීමට ගැමියෝ වගබලා ගනිති. දළදා මාලිගාවේ බුද්ධ පූජාව සඳහා මුළුතැන්ගෙයි දාන වට්ටෝරුවේ කිතුල් ගසෙන් ලබා ගන්නා ද්‍රව්‍ය දෙකක්ම ඇතුළත්ය. එනම් "ඇල් තෙලිජ්ජ" බෝතල් කාලයක් හා "හකුරු" ලොකුමුල් එකක් වශයෙනි. (1)

"මීරා" හෙවත් "තෙලිජ්ජ" ස්වභාවිකව පැසීමට හැරීමෙන් එම බඳුනේ තැම්පත් වන ඝන ස්ථරය "මණ්ඩි" යනුවෙන් හැඳින්වේ. කිතුල් මලෙන් ලබා ගන්නා තෙලිජ්ජවල මුල් අවස්ථාව "පෙත" යනුවෙන් හැඳින්වෙන අතර "පෙත" එම බඳුනේම තබා තිබීමෙන් "මණ්ඩි" සෑදේ. මේ මණ්ඩි බේරීමෙන් ශේෂවන දියරය "රා" නම්වෙයි. ශරීරයේ අධික උනුසුම නැතිකර ගැනීමටත්, මූලවාත ආදී රෝග නිවාරණයටත් උදේ-හවස ස්වල්පයක් වශයෙන් "රා" පාවිච්චි කිරීම එහි ඖෂධ ස්වභාවය තහවුරු කරන්නකි. "රා" අධික ලෙස පාවිච්චි කිරීමෙන් මානසික විකෘති තත්වයට පත්වේ. එවිට එහි ඖෂධ ගුණය නැතිවී සුරා ගතිය ඉස්මතු වෙයි.

"මල්තැලීම" අවසන් කළ කිතුල්ගස (මල් වැරීම) බිම හෙළා ගසේ මදය ගෙන පොඩිවට කපා වනයේ කොටා, එම කුඩු කඩපිම්මේ තම්බා නැවැත එම කුඩු අනා පෙරා ගන්නා ද්‍රව්‍ය "කිතුල් පිටි" යනුවෙන් හැඳින්වේ. වනයේ කොටා ගැනීම "කුඩු ගහනවා" යනුයි. නූතනයේ "කුඩු ගහනවා" යනු මත් ද්‍රව්‍ය භාවිතයේ එක් අවස්ථාවක් වුවත් ජන ව්‍යවහාරයේ එනමින් හඳුන්වන්නේ ගසකින් පිටි ලබා ගැනීමේ ක්‍රියාවලියයි. කිතුලෙන් ලබා ගන්නා පිටි වලින් ගැමියෝ ඉතා රසවත් ආහාර තනති. "කිතුල් තලප" ඒ අතර විශේෂ වේ. ඉතා ගුණ මෙන්ම පෝෂ්‍යදායි ආහාරයක් වන කිතුල් තලප, පොල්කිරි, පැණි, සීනි සමග ආදේශ කොට ආහාරයට ගැනීමෙන් ශරීරයේ සීතල ආරක්‍ෂා කර දෙයි. උෂ්ණාධික රෝගවලට දිව්‍ය ඖෂධයක් බඳුය.

කිතුල්ගස පිළිබඳව අභිචාර විධි පද්ධතියක් අනුගමනය කිරීම පැරණි ගම්වල අද ද දක්නට ලැබෙයි. "මල මදින්නා" තත් කටයුත්ත සිදු කරනු ලබන්නේ අන් අයට නොපෙනන ලෙසටය. "මල මදින" විට වෙනකෙකුගේ නෙත ගැටීම "මල වැරීමට" (මීරා වැටීම නතර වීම) හේතුවන බව ඔවුන්ගේ විශ්වාසයයි. එසේම කුළුදුලේ දරු ප්‍රසූතියක් බලාපොරොත්තු වන කාන්තාව "මල් මැදීම" දෙස බැලීමෙන් "මල ඇරෙන" බවට ශ්වාසයක් තිබේ. "මල ඇරීම" යනුද "මල් වැරීමය" පළමුව ගන්නා "මීරා" මඳක් උණුකොට බුද්ධ පූජාව තැබීම සමහර "මල් තලන්නන්ගේ" සිරිත වේ. එසේම දෙවියන් උදෙසා ගන්නා පූජාවන් සඳහාද කිතුලෙන් ගන්නා මේ ද්‍රව්‍ය භාවිත කරන බව පෙනේ. නුවණ දෙන්මට නම් ජනකවි පද්‍ය පංතියේ එන පහත ගීයෙන් ඒ බව පෙනේ.

"තැඹිලි තඹුතෙල් නවසි බෝදිලි තල් කිතුල් උඳුකැන් මෙනා
ලේන තැරී දෝතලු පුවක්වලු කැදලි සුවදෙල් සමඟිනා
ලබු පුහුල් නාරන් දොඩන් අඹ රසැති වැල වරකා ගෙනා
තෙදැති ගණපති නුවණ දෙන්මට පුදමි මේ හැම සිතු මෙනා (2)

ඇල්තෙලිජ්ජ, රා, පැණි, කිතුල් හතුරු ආදී ද්‍රව්‍ය දේව පූජාවේදී යොදා ගන්නා බවයි එකවෙන් කීවේ.

"වේවැල් කෝටු නාරන් සියඹලා අතු
<u>කිතුල්</u> පොල් ඉරටු වැල් කසඹිලියා අතු (3)

කිතුල් ඉරටුව දඬුවම් පැමිණවීමට පැරැන්නෝ භාවිත කළ බව එයින් ධ්වනිත කෙරෙයි.

කිතුල් ගස ගැමි ජනයාට ඉතාමත් එලදායි සමීපතම වෘක්ෂයකි. ඒ නිසාම කිතුල්ගස හා බැඳි ක්‍රියාදාමය පදනම් කරගත් ජනකවි සාහිත්‍යයක් ද බිහි වී ඇත. කිතුල් ගස සම්බන්ධව අප මුල්දී සඳහන් කළ ශබ්ද කෝෂය එම ජන ගී වලින්ද දැක ගැනීමට පුළුවන. හාසෝත්පාද ප්‍රබන්ධ සාහිත්‍යයේ කිරුළ පැළැඳි අන්දරේ මල් මදින්නෙකුගෙන් "රා" ඉල්ලා එය නොලැබුණු විටදී වස් කවියක් කියා රා ලබාගත් අයුරු හා නැවත එම වස් කවියෙන් ඔහුව බේරා ගැනීමට සෙත් කවියක් කියූ අයුරුත් ජන කවි එම සාහිත්‍යයෙන් ලැබේ.

"තබන තබන <u>උන ගැට</u> පෙළ කැඩීයන්
බඳින බඳින <u>වැල්පොට</u> හැර කැඩීයන්
කපන කොටන මන්නේ ලේ ගැවීයන්
මට <u>රා</u> නොදුන් තෝ ගහ මුල වැටීයන්

"කලුවෙන් කලුවරයි අපෙ ගම <u>මදින්නා</u>
<u>මණ්ඩි</u> නැතුව හැමටම රා බෙදන්නා
එන එන කැකුළු මල් නැරම තලන්නා
දෙයියොම රැක දෙවන් අපෙ ගම <u>මදින්නා</u>

මෙයින් පෙනෙන්නේ කිතුල්ගස හා සම්බන්ධ පාරිභාෂික වාග්මාලාවේ සංවර්ධනාත්මක අවස්ථාවයි. ගැමියෝ කිතුල්ගස සම්බන්ධව විවිධ අවස්ථාවලදී උපමා භාවිත කර ගනිමින් පද්‍ය නිර්මාණයට පෙළඹුණහ. ගැමියාගේ නිර්ව්‍යාජ කාව්‍ය චින්තාවන් තම පරිසරයේ අවස්ථාවන් හා බද්ධ කොට ගැනීමෙන් පැහැදිලි වන්නේ කිතුල්ගස හා බැඳි සාඩම්බරයයි. කිතුල්ගස තම දෛනික ජීවිතයට කොතරම් සම්බන්ධ වුයේද යන්න පහත ජන කවියෙන් මනාව නිරූපණය කරයි.

"අප්පච්චි අපෙ ගේ දොර කිතුල වාගේ
අපේ අම්මා ඒ කිතුලේ පැණි වාගේ
ලොකු අක්කා ඒ කිතුලේ මල වාගේ
පර අම්මා මා උස්සා කොළ වාගේ

ගේ අබියය කිතුල පියෙකුගේ ආරක්ෂාව හා සමාන වන්නේ එයින් ලැබෙන ආර්ථික වටිනාකම නිසයි. මවගේ සෙනෙහසට කිතුල් පැණි උපමා වුයේ එහි ඇති දැඩි මිහිර නිසයි. නැඹුල් යුවතියක වූ අක්කාගේ සුන්දරත්වය කිතුල් මලෙන් ධ්වනිතයි. මේ සෑම ප්‍රකාශනයකම ඇතුලත්ව ඇත්තේ කිතුල් ගසේ ආර්ථික හා සමාජ සම්බන්ධතාවයි. යමෙකුට තම වටිනාම වස්තුව මව - පියා හා ඥාතීන්ය. එම වටිනාකම කිතුල් ගසට උපමා කොට දැක්වීමෙන් පැහැදිලි වන්නේ ගැමියාගේ ජීවිතයට කිතුල් ගසේ ඇති සමීප සබඳතාවයි.

කිතුලෙන් ලබා ගන්නා "රා" ඖෂධයක් මෙන්ම සුරාවක් ලෙසින්ද භාවිත කළ හැකි බව අපි ඉහතදි ප්‍රකාශ කෙළෙමු. "රා" බී අධික ලෙස මත් වූ තැනැත්තා සුරා දූර්තයකු වෙයි. ඔශු සමාජයේ නින්දා අපකීර්ති ලැබීමට පත්වෙයි. එවැනි අවස්ථාවක් මිහිරිපැන්නේ ධම්මරතන හිමියන්ගේ පත්හිදෙන් "සිලෝ" ආරෙන් එළි දකින්නේ මෙසේය.

"පිට පට ගසමින් අවුදින් සුරා පාන සාලා
වට වැද කට ගන්නක් රා බොමින් මත්ව ඌලා
කට කෙළ රැවුලේ හොස්සේ කොතින් වැක් කිරිලා
කොට කොට ඇවිදීමෙන් ගෙන් ගෙටත් කෝල හාලා"

"නිරලඹ අහසේ එල්ලෙන්නට වෑයම් කෙරෙත් මැයි
ඉර සඳ උදුරා ගන්ටත් අහස් හී පනින් මැයි
පොරවැද උනුනුන් හා තන්හි තන්හී වැටෙත් මැයි
ගරගඳ කුණු රා බී රොස් පරොස් බස් කියත් මැයි" (6)

කිතුල් ගසේ ආර්ථික වටිනාකම පිළිබඳව විස්තර කිරීම මෙහි අරමුණ නොවේ. නමුත් කිතුල්ලීය සම්බන්ධ කර ගනිමින් ගැමියෝ විවිධ භාණ්ඩ තනා ගත්හ. "වියගහ, මෝලගහ, නඟුල, ඇඳපොලු, පරාල, පෝරු ලැල්ල ඒ අතර ප්‍රධාන තැනක් ගනී. ඉතා ශක්තිමත් දැව වර්ගයක් ලෙසින් සැලකෙන කිතුල් ලීය දොර ජනෙල් උළුවහු වලටද භාවිත කෙරෙති. ශ්‍රී දළදා මාලිගාවේ වරිච්චි බිත්ති අතර ඇත්තේ කිතුල් ගසෙන් ලබාගත් රීප්ප වන අතර එහි වහලයේ කිතුල් පරාල දැක ගැනීමට පුළුවන.

විවිධ වටිනාකමකින් යුක්ත කිතුල් ගස සම්බන්ධ වටිනාකම් ප්‍රදේශයෙන් ප්‍රදේශයට විවිධ විය හැකිය. කිතුල සම්බන්ධ අභිචාර හර පද්ධතියක් ජන විඥාණය තුළ ව්‍යවහාරිතය. නමුත් භාෂාත්මකව බලන කල ඉතා වැදගත් වන්නේ ඒ හා බැඳි ශබ්ද මාලාවයි. ජන ගී සාහිත්‍යයේද, භාෂාත්මක උපයෝගීතාවෙහිද කිතුලෙහි සම්බන්ධ වාග් මාලාව මේ වන විට සීග්‍රයෙන් විනාශ වී යන බැවින් ඒ පිළිබඳව කාගේත් අවධානය යොමු විය යුතුය. කිතුල් නිෂ්පාදනයේ නෛතික ක්‍රියා කලාපය පිළිබඳව ගැමියන් තුළ පවතින අප්‍රසාදය නිසා කිතුල් නිෂ්පාදනය වඳවී යන කාර්යයක් බවට පත්ව ඇත. ඒ හා බැඳි පාරිභාෂිත ශබ්ද මාලාවත් ඒ සමගම විනාශ වී යයි. එබැවින් අපගේ මේ ලිපියෙහි පරමාර්ථය වුයේද තත් ශබ්ද කෝෂය ආරක්ෂාකර ගැනීමයි. කෙසේ වතුදු කිතුල් ගස හා සම්බන්ධ මේ සිංහල ශබ්ද මාලාවේ පවතින වාග් කෝෂය ප්‍රදේශයෙන් ප්‍රදේශයට විවිධ විය හැකිය.

# පාදක සටහන්


(01) සාරථි, දළදා පුරාණය, වරකාවේ ධර්මාලෝක හිමි
මධ්‍යම පළාත් සංස්කෘතික අමාත්‍යාංශය, 1992, 27 පිට.

(02) සිංහල කාව්‍ය සංග්‍රහය, "නුවණ දෙන් මට", ආරිය රාජකරුණා
ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 2002, 101 පිට.

(03) සිංහල කාව්‍ය සංග්‍රහය, "උගත මනා ශිල්පයමයි මතු රැකෙනා"
එම, 99 පිට.

(04) හද බැදි ජන කවි, "අන්දරේගේ කවි", ලාල් ගුණසේකර
විජය කුමාර් පෙරකුම් ප්‍රකාශන, මහනුවර, 2004, 278 පිට.

(05) සිංහල කාව්‍ය සංග්‍රහය - එම - 139 පිට.

(06) සිංහල කාව්‍ය සංග්‍රහය - එම - 04 පිට.


# දත්ත සපයා දුන් අය


(1) කේ.ජී.අමරපාල මයා - මාතලේ - මාතලාපිටිය.

(2) ඒ.ජී. අමරදාස මයා - මාතලේ - මාතලාපිටිය.

(3) පී.ජී.ජයවර්ධන මයා - මාතලේ - මාතලාපිටිය.

(4) යු.එච්.ඩී.බුද්ධික ලක්මාල් ශ්‍රී කපිලරත්න - මාතලේ - මාතලාපිටිය.

(5) පී.ජී.රණසිංහ මයා මාතලේ - මාතලාපිටිය.